# 28

# ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් සම්බන්ධයෙන් තොරතුරු සුඟක්

වැ.බ. පුස්තකාලයාධිකාරී වයි. කේ. තිස්ස බණ්ඩාර
බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

ආදියෙහි පටන් ලිවීමට යොදා ගත් දැනුදු වෙසෙසි වුවමනාවක් සඳහා කලාතුරකින් යොදා ගැනෙන ද්‍රව්‍ය විශේෂයකි පුස්කොළ ය. පුස්කොළ යන වදනේ තේරුම කුමක් ද? පුස් - නම් ධාතුවක් ක්‍රියා මූලයක් සිය බසෙහි ඇත. වැලිවිටියේ සෝරත නාහිමියන්ගේ ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි ඒ ධාතුව මේ නමින් විස්තර කරනු ලැබේ.[1]

| | | |
|---|---|---|
| පුස් (ධා) | = | පිස දැමීමෙහි පුසී පුසිත් ; පිසි, පිසී. (පුස්මින් - නෛක්‍රි - ධප්‍ර 234[22]) |
| පුසන් (පුස්දජන) | = | අශුචි පිසදමන ලීකෝටුව (සිබ 5[47]) |
| පුසන් කවුළු | = | පුසන් දඬු පිටතට දැමීමට වැසිකිළි බිත්තියෙහි කළ සිදුර (හෙසි 24[10]) |
| පුසන් කිස | = | පුසනින් කටයුතු කෘත්‍යය ; මල පිසදැමීම (සිබ 5[28], හෙසි 24[10]) |
| පුසන් දඬු | = | මල පිස දමන ලී කැබැල්ල (කැප්‍රු 167, කංකා 113[39]) |

පුස් යන්නෙහි දැක්වුණු අරුත් ගත්තා ලද්දේ පැරණි පොතපතිනි. ඒ සියලු පොත් ආරාමික ජීවිතය පසුබිම් කොට ගෙන සැකැසුණු ඒවායි. ලිවීමේ කාර්යය හා සම්බන්ධ ඒවා නොවෙයි. පිස දැමීමට, පිරිසිදු කිරීමට ගන්නා කොහු, ඉදල්, ලී කැබලි යනාදී උපකරණ ලිවීමට ගන්නා ද්‍රව්‍යට බෙහෙවින් වෙනස් යැයි

කෙනෙකුට පෙන්වා දිය හැකිය. ඒ බැවින් පුස්කොළයත් ඒ ද්‍රව්‍යයත් අතර සම්බන්ධයක් වේ නම්, එය ඉතා දුරස්ත යැයි තර්ක කළ හැකිය.

පුස් (පිසීමෙහි) සකර්මක ධාතුවක් ද ඇත. එය අරුත් දෙකක වැටෙයි. එකක් පිසීම, (අහර) ඉවීම යන අරුත යි. අනෙක පිසීම, පිසදැමීම යන්නයි. මේ ප්‍රථම ධාත්වර්ථයෙන්, එනම් අහර පිළියෙල කිරීමේ අරුතින්, පිසූ නම් අතීත කෘදන්ත පදයක් සෑදෙයි. පිසූ යන්නක් ලැබෙතත්, පුසු, පුසු වැනි රූප ගැන අස්නනට නො ලැබෙයි. ලිවීමේ කාර්යය සඳහා ගනු ලබන ද්‍රව්‍ය තල ගොබයයි. පත්‍ර අසූවක් සියයක් පමණ ඇති තලගොබයේ ඉරටුව ඉවත් කොට දැවැටුමක් ලෙස ඔතනු ලැබේ. ඒ දැවටුම ලොකු දිය හැලියක බහා පැය කිහිපයක් මඳ ගින්නේ තම්බනු ලැබේ. මේ අරුතින් තැම්බූ කොළය පිසූ කොළය පුස්කොළය වන්නට ඇතැයි සිතන්නට කිසිවකු පෙළෙඹෙන්නට බැරි නැත. එහෙත් යට කී පරිදි, අතීත කෘදන්ත රූපය වන පිසූ යන්න පුසු, පුස් යන්නට පෙරළිණි යි සිතීම අසීරුය. පිසදැමූ පිරිසිදු කොට ගත් යන දෙවන අරුත්හි වැටෙන රූපයෙන් සාදාගත් අතීත කෘදන්ත රූපයක් පුස්කොළ යන්නේ මුල් ශබ්දයට සම්බන්ධ කර ගැනීමට ඒ හේතුව ම බාධක වේ.

පිස දැමූ, පිරිසිදු කොටගත්, පිසූ (තැම්බූ) යන අරුත් ඇති පුස් - ධාතුව ම පුස්කොළය යන පදයේ මුල් ශබ්දය වන්නට නොහැකි ද? ගැටලුවකට ඇත්තේ ක්‍රියා මූලය, එනම් ධාතුව ම අතීත කෘදන්ත අර්ථයෙන් යෙදෙන බවක් සිංහල ව්‍යාවහාරයෙහි නොයෙදීමයි. බල, බම, බණ, පිහිටි, රක්, බස්, යන ක්‍රියා මූල පිළිවෙළින් බැලූ, බැමූ, බිණූ, පිහිටු, රැකි, බට යන කෘදන්තාර්ථ ගැප් කොට ඇත්තේ ද? පිසූ, පිරිසිදු කොට ගත් යන අරුත් පුස්කොළය ඇඳින්නීමට යෝග්‍ය වුවත්, එසේ ම ඒ කොළය වෙසෙසා දැක්වීමට සුදුසු විශේෂණ පද වුවත් පිසූ කොළය පුස්කොළයට පෙරළුණා යි ගැනීම සිංහල භාෂා රීතියට පටහැනි යැයි මහාචාර්ය ආනන්ද කුලසූරිය එහි සඳහන් කරයි. පුස් - කොළ, පත් (කංකා 111[b]) යන්නට ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි අරුත් දැක්වෙන්නේ කිසිවක් නො ලියූ හිස් කොළය යන ලෙසිනි. එසේ ම පුහු ගෙඩි යන්න පොතක් මෙන් සෑදූ තල කොළ මිටිය ලෙසින් හැඳහන්වෙයි. මෙ තැන්හි පුස්, යන්නට දී ඇත්තේ අමුතු ම අරුතකි. එනම් හිස් යනුයි. හිස් යන අරුත් ඇති පුහු යන නාම පදයක් ඇත. එය නාම විශේෂණයක් ලෙස ද යොදෙයි. පුහු පොල්, පුහු ගෙඩිය යන තන්හි මෙනි. පුස්ස, පුහු, පුස්සෙන්. පුස්සට යන අයුරින් එන නපුංසක ලිංග නාමපදයක් ලෙස වරනැගෙයි. පුහු කොළය, පුස් කොළය වන්නට හැකිය. එහෙත් එහි හිස් යන අරුත ලැබුණේ කිසිවක් නො ලියූ හෙයින් ද, නැතහොත් අපිරිසිදු දෑ ඉවත් කොට පිරිසිදු කරන ලද හෙයින් දැයි ඉඳුරා ම කිව නොහැකිය. මහාචාර්ය

ආනන්ද කුලසූරිය එහෙත් පුස්කොළ යන්නේ නිර්වචනය පිළිබඳ ව දිගු විස්තරයක් කළ ද ස්ථිර නිගමනයක් නො දක්වයි.

ව්‍යවහාර වර්ෂයෙන් දහනව වන ශතකයේ මුල් හරියේ සිංහල - ඉංග්‍රීසි ශබ්ද කෝෂයක් සැපයූ බෙඤ්ජමින් ක්ලෆ් දේවගැතිතුමා පුස්කොළ යන්නට අරුත් කියන්නේ හිස් කොළය ලිවීමට හෝ උල් කටුවෙන් සීරීමට පිළියෙළ කොට ගන්නා ලද හිස් කොළය යන ලෙසිනි.[2]

පුස්කොළ යන්නට අරුත් සපයන අරිසෙන් අහුබුදු මහතා මෙසේ දක්වයි.

පුස්කොළ (නා.පි.) ආදියෙහි පොත් ලිවීමට යෙදුණු තල (ගසේ) පත් යැ. පුස්කොළ සැකැසුණේ තල ගොබ තම්බා ගැනීමෙනි. මේ තල කොළෙහි මුලින් බුදුදහම ලියැවුණෙන් එ මැ පත් පුදට (පූජාවට) තිසි වී. පුදට තිසි කොළ > පුද ලද කොළ පුද කොළ > පුද්කොළ > පුත්කොළ > පුස්කොළ යි, ත් හට ස් වීම මේ බසේ සන්දි නියරෙකි.[3]

මෙරට හා විදේශයන්හි පුද්ගලයන් සතුව ඇත්තා වූ ද, විවිධ ආයතනයන් හි තැන්පත් කොට ඇත්තා වූ ද, සිංහල පුස්කොළ පොත් සංඛ්‍යාව හැත්තෑපන් දහසක් පමණ බව කිව හැකිය. මෙයින් සියයට අනූපහක් පමණ දහඅටවන දහනමවන සියවස් තුළ ලියන ලැදැ යි සිතීමට සෑහෙන සාධක ඇත්තේය. ප්‍රමාණවත් පුස්කොළ පොත් සංඛ්‍යාවක් විසිවන සියවසේ මුල් භාගයේ ලියන ලද බවත් සැලකිය යුතු ය. දහ අටවන සියවසට පෙර ලියන ලද පුස්කොළ පොත් හමුවන්නේ ඉතා විරල වශයෙනි. ගම්පල හා කෝට්ටේ රාජධානි පැවති කාලයෙහි ලියන ලද පුස්කොළ පොත් කිහිපයක් ඉඳහිට හමුවන නමුත් ඊට පෙර එනම් දහතුන්වන සියවස තුළ ලියන ලදැ යි සැලකිය හැකි පුස්කොළ පොත් දැනට සොයා ගෙන ඇත්තේ සතරක් පමණි. පොළොන්නරු රාජධානිය හෝ අනුරාධපුර රාජධානිය පැවති කාලවල ලියන ලද යි සැලකිය හැකි එක ද පුස්කොළ පොතක් මා දන්නා තරමින් තව හමු වී නැත.[4]

මහාචාර්ය පී.ඊ.ඊ. ප්‍රනාන්දු දක්වන දඹදෙණි රාජධානි සමයෙහි හෙවත් දහතුන්වන සියවසෙහි ලියන ලද දැනට ලක්දිව පැරණි ම පුස්කොල පොත් හතර පහත දැක්වේ.

1. චුල්ලවග්ගය (කොළඹ ජාතික කෞතුකාගාරය)
2. විසුද්ධිමග්ග ටීකාව (පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය)
3. සාරත්ථදීපනී නම් විනය ටීකාව පළමු කාණ්ඩය. (ලන්ඩන් නුවර බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය)

4. සාරත්ථදීපනී පිටපත - (පැරිස් නුවර ජාතික පුස්තකාලය.)

පැරණිකම නිසා ම විශේෂ තැනක් ගන්නා තවත් පුස්කොළ පොත් රාශියක් ගැන ද සඳහන් කිරීම වටනේය.[5] ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය (වර්තමාන කැලණිය විශ්වවිද්‍යාලය) සතුව ඇති මහාවග්ගපාලියෙහි පුස්කොළ අත්පිටපත ද, 13 වන සියවසට අයත් සේ සැලකේ. කොළඹ කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති සංයුක්ත නිකාය අත් පිටපතෙහි එන අවසාන පාඨය අනුව එය පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන් විසූ මංගල නම් භික්ෂූන් වහන්සේ නමක් විසින් ක්‍රි.ව. 1412 දී පිටපත් කැරුණු බව පෙනේ. කෞතුකාගාර පුස්තකාලයේ ඇති ක්‍රි.ව. 1512 දී පිටපත් කරන ලද පාළිපරමත්ථප්පකාසිනී නැමැති පිටපත ධම්මසංගනී නැමැති පාලි ග්‍රන්ථයෙහි ටීකාවකි. සිංහල පූජාවලියෙහි අත්පිටපතක් ද කෞතුකාගාර පුස්තකාලයෙහි ඇත. එහි එන අවසාන පාඨය අනුව එය ක්‍රි.ව. 1665 දී පිටපත් කරන ලද්දකි. කෞතුකාගාර පුස්තකාලයෙහි ඇති තවත් පැරණි පුස්කොළ අත්පිටපතක් නම් සංස්කෘතයෙන් ලියැවී ඇති බෞද්ධ ශතකයයි. ක්‍රි.ව. 1704 දී පිටපත් කරන ලද්දකි.

දකුණු සහ අග්නිදිග ආසියානු රටවල කඩදාසි හඳුන්වා දීම ට පෙර ප්‍රධාන වශයෙන් ලිවීමට ගන්නා ලද ලේඛන මාධ්‍ය ලෙස පුස්කොළ සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවට කඩදාසි භාවිතය හඳුන්වා දුන්නේ ක්‍රි.ව. දහසය වැනි සියවසේ මුල දී මුහුදු බඩ ප්‍රදේශ අල්ලා ගත් පෘතුගීසීන් විසිනි. එහෙත් කඩදාසි භාවිත වූ කාලයේ දී ද ලේඛන මාධ්‍යයක් ලෙස පුස්කොළ භාවිත විය. ශත වර්ෂ ගණනක සිට ශ්‍රී ලංකාවේ ලේඛන මාධ්‍යය ලෙස පුස්කොළය භාවිත වූ බව පෙනේ. විදේශීය රටවලින් දැනට ලැබී ඇති පැරණිම පුස්කොලය ක්‍රි.ව. 2 වැනි සියවසට අයත් වේ. එය මධ්‍යම ආසියාවේ තිබී සොයා ගන්නා ලද්දකි. ඉන්දියාවේ ක්‍රි.ව. 10 වැනි සියවසට පෙර ලියූ පුස්කොළ හමු වී නැති අතර, ශ්‍රී ලංකාවේ දැනට හමු වී ඇති පැරණි ම පුස්කොළ පොත ක්‍රි.ව. 13 වැනි සියවසට අයත් චුල්ලවග්ගය බවට සාක්ෂි ඇත.[6]

පැරණි පොත් පිළිබඳව ලංකාවේ විවිධ සාහිත්‍ය මූලාශ්‍ර අනුව තොරතුරු හෙළිවෙයි. ඒවායෙන් වැඩි ප්‍රමාණයක් පුස්කොළ මාධ්‍යයෙන් ම ලියන්නට ඇතැයි අදහස් කරමු. එකී පොත් සම්බන්ධව තොරතුරු කිහිපයක් මෙසේයි. ධර්මයාගේ චිරස්ථිතිය පිණිස පොත්හි ලියූහ.[7] බුද්ධඝෝෂ හිමි මහාවිහාරයට පැමිණ, අටුවා කරන්නට මට සියලු පොත් දෙවයි කීහ.[8] ධාතුසේන තරුණ තෙමේ වනපොත් කිරීමේ දී වර්ෂාවක් වැටුණි. එහි දී පොත හා කුමරු නාගයකු විසින් නො තෙමා රකින ලදී.[9] කසුබ් රජතෙමේ විජම්පෙළ රන්පත ලියවා දම් සඟුන පොත නන් රුවනින් හොබනා කොට නුවර මැද උතුම් ගෙයක් කරවා

බවට සාධක ඇත. විශේෂයෙන් ම ජාතක පොත් වහන්සේ, ධම්මචක්ක සූත්‍රය සහ සතිපට්ඨාන සූත්‍රය මේ අතරින් මූලික වේ. වැඩි ම ප්‍රතිශතය වාර්තා වෙන්නේ සතිපට්ඨාන සූත්‍ර පොත් බව පෙනේ.[23] පොත් පමණක් නොව පොත් ආශ්‍රිත සෙසු උපාංග ද පූජා කිරීමේ අනුසස් පුරාණ කථිනානිසංසයේ සඳහන් වේ..... පොත්ගෙඩි, පොත් ලනු, පොත් සකි, පොත් පයි, පොත් කැති, පොත් පෙට්ටි, පොත් කම්බිලි, දණ්ඩාසන, බණවසුන්, පිටාටුපොරු, පරමදාන, දෙබලකටු, පන්සිත්, පන්සිත්කොපු..... ආදී වශයෙනි.[24]

එබඳු පසුබිමක් ඇති ලංකාවේ පුස්කොළ පොත් සැලකිය යුතු ප්‍රමාණයක් වර්තමාන විහාරස්ථාන සතුව ඇත්තේය. ඇතැම් විහාරයක් වෙනුවෙන් නාමය යෙදී ඇත්තේ ද පොත් ගුල් විහාරය වශයෙනි. මෙයින් හඟුරන්කෙත පොත්ගුල් විහාරය එකක් පමණි. එහි සැලකිය යුතු ප්‍රමාණයක පුස්කොළ පොත් තැන්පත් ව ඇත. විශේෂයෙන් ම ලංකාවේ මධ්‍යම පළාත, වයඹ පළාත සහ දකුණු පළාතේ විහාරස්ථාන රැසක පුස්කොළ පොත් ඇතැයි කියැවේ. ඇතැම් තැනක පැරණි පොත් ක්‍රමයෙන් විනාශයට පත් වීමත් එකී එකතු තුළින් අතුරුදහන් වීමත් සිදුවෙමින් පවතී. සොර සතුරන් විසින් පුරාවස්තු හැටියට විකුණනු ලබන අවස්ථාවල දී ඉතා කලාතුරකින් අසු වූ තැන් ද ඇත. මේ එක් නිදසුනකි. ... මම ගුවන්තොටුපලේ දී අත් අඩංගුවට ගෙන තියෙනවා පුස්කොළ පොත්වල කොටස් ඒවායේ කැල්ලක් මෙහේ අනෙක් කොටස ජර්මනියේ. අන්තිමටම ඒවා කාටවත් නෑ....[25]

පුස්කොළ පොත් කොල්ලකෑමක් ගැන ඇසින් දුටු සාක්ෂියක් මෙසේය.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාහස් තුන්සිය පන්සාලිස් වන වර්ෂයෙහි නවන් මාසයේ දී ඉංග්‍රීසි ගොල්ල නුවර ආදා පෝය ගෙයි පිළිත් සමග අඩු වැඩිය දේ ඇරගෙන පොත්පයිත් පොත්ලෙන්සුත් හොරු අරගෙන ගියදා මේ පොත් වහන්සේ කෙරෙහි ගෞරවයෙනුත් ශාසනයට උපකාර පිණිස රඹුකන සොභිත උන්නාන්සේ වන මා විසින් ඇරගෙන හන්තානේ කැලේ හරහා පරවෙස්සන් කරගෙන ආවාය මේ පොත බලා වදාරණ කෙනෙක් මට පින් දෙනවා හොඳයි.... යනුයි.[26]

පුස්කොළ පොත් එකතු ගැන මහාචාර්ය ඩබ්.එස්. කරුණාරත්න මෙසේ කියා තිබේ.

......... අමුද්‍රිත පාලි, සිංහල සංස්කෘත පොත පත ප්‍රකාශයට පත් කළ යුතු ය. දැනට පොත් ගුල්වල හා විහාරස්ථානවල තල්පත්වලට සීමා වී ඇති සියලු අමුද්‍රිත, සිංහල, පාලි, සංස්කෘත පොත පත නොපමාව ප්‍රකාශයට පත් කරවීමට

විධිමත් පියවර ගැනීම පිණිස භික්ෂුව ඉදිරිපත් විය යුතු යි. මම ගියා දවසක් දළදා මාළිගාවට පත්තිරිප්පුවේ පොත් පත් වැස්සට තෙමෙනවා අව්වට වේලෙනවා. ඒවායේ බහුල වශයෙන් හිටියේ කාවෝ.... මම හොඳට දන්නවා මේවා තියෙන තැන් ඔක්කොම දියබත් වේගෙන යනවා වටිනා පොත් පත් පත්තිරිප්පුව ඇතුලෙ පොත්පත් ටික දියබත් වෙනවා. අන්න හුඟක් තියෙනවා අස්ගිරියෙ....[27]

මෙය කලකට පෙර එතුමා දුටු දෙයකි. දැන් මේ තත්ත්වය වෙනස්ව ඇත. හොඳින් ආරක්ෂා වී තිබේ. පසුගිය සමයේ දළදා මාළිගයට එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් මේ පොත් එකතුවට ද බරපතල හානි සිද්ධ විය. පිළිස්සීමකට ලක් නොවුයෙන් විසිර ගිය පොත කැඩී බිඳී ගිය පොත් නැවත සකසා තබන්නට එවකට සිටි දියවඩන නිලමේවරයා සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයේ අදාළ කාර්ය මණ්ඩලය කදිම උත්සාහයක යෙදී ඇත. එම උත්සහය සාර්ථක ව ඇති බව කිව මනාය.

පොදු වශයෙන් සලකන විට ලංකාවේ පුස්කොල පොත් එකතු විවිධ තැන් හි ස්ථානගත ව ඇත. විහාරස්ථානවලට අතිරේකව කොළඹ ජාතික කෞතුකාගාරය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන ස්ථාන දෙකෙහි වැඩිම එකතු ව ඇති බව කියැවේ. කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ඇති පුස්කොළ පොත් එකතුව 1870 සමයේ සිට ආරම්භව ඇත.[28] එම එකතුව සඳහා දිවයිනේ විවිධ පළාත්වලින් එතෙක් පැවැති පිටපත් සහ අලුතින් ලියන ලද පිටපත් රැසක් අන්තර්ගත වේ. දැනට වසර සියය ඉක්මවා ඇති එකී පිටපත් සියල්ල ඓතිහාසික ග්‍රන්ථ විද්‍යාව අතිනුත්, කෞතුක වටිනාකම අතිනුත් ඉහළ අගයක් ගනී. මේ පිළිබඳ ව ඩබ්.ඒ. සිල්වා මහතා විසින් සකසන ලද නාමාවලිය ප්‍රථම භාගයේ ග්‍රන්ථ 2362 ක් සඳහා කිසියම් ප්‍රමාණික විස්තර ඇත. පිටපත් ලබා ගැනීම පිළිබඳ ඇති විස්තර අනුව ඒ සමයෙහි යම් යම් කරුණු දැනගැනීමට ඉඩ තිබේ. විශේෂයෙන් ම මුල් පිටපත් අයිතිකරුවන් සහ පිටපත් කළ ලේඛකයන් මෙන් ම එකී ස්ථාන ද දැන ගැනීමට අවස්ථාව ලැබේ. ඒ නිදසුන් කිහිපයක් මෙහි දක්වමු.

1. .... ගෞරවණීය එච්. සී. පී. බැල් මන්ත්‍රීතුමාගේ සිංහල ලිපිකරුවෙක් වූ සාමියෙල් කීර්තිරත්න ගුරුන්නාන්සේ වන මා විසින් ක්‍රි.ව. 1894 ක් වූ අප්‍රියල් මස 4 වෙනි දින ලියා නිමකරන ලදී. අනුරාධපුරයේ දීය. හිඹුටුගොල්ලෑවේ පොත් පිටපත යි.[29]

2. වතුරෙ ධම්මරතන උන්නාන්සේ විසින් ලියවාපු සංයුත් සඟිය.....[30]

3. තරාණගොල්ලාගම උපාසකදූරයා ලියවාපු දම්පියාවේ ගාථා පොත් වහන්සේ නිමි.[31]

4. මිරිස්සේ පදිංචි අප්පුහැන්නැදිගෙයි බබන් නොහොත් අන්ද්‍රියස් විසින් ලංකාවේ රජ්ජුරුවන් වහන්සේගේ පොත්ගුලට බාරදෙන්ට යෙදුනා ඇත....[32]

5. සක වර්ෂ එක්වාදහස් සත්සිය අසූ තුනට ලත් සතරවැනි කකුලු භානු සම්ප්‍රාප්ත පසලොස්වැනි රිවි දින දෙබල්ගල විහාරෙ විහරණ කරණ කපිරිග්ගම චන්ද්‍රජෝති භික්ෂුහු විසින් නෙර්වාණසම්පදාව නිසා පත්තිරු තිස්හයක රුවන් සූත්‍ර අර්ථ සහ පද ඇණුම ලියා ස්ථාපිත කළාය....[33]

එකී පිටපත් තුළින් ද සමකාලීන භාෂා ව්‍යවහාරය ආදී විස්තර ද එලෙසින් පෙන්නුම් කෙරේ.

වර්තමාන ජාතික කෞතුකාගාර පුස්තකාලය ආරම්භයේ දී කොළඹ රජයේ පෙරදිග පුස්තකාලයෙහි මේ සඳහා පුස්කොළ පොත් සෙවීම පිණිස යටත් විජිත ලේකම්වරයාගේ පත්වීම අවසරය මත කටයුතු කර ඇත්තේ ලුවී ද සොයිසා මුදලිවරයා ය. ඔහු ගමින් ගමට දුෂ්කර සේ ගමන් කොට දුර්ලභ ගණයේ පොත් ද සොයා ගෙන ඇත. මෙතුමාගේ අතිශය දුෂ්කර කටයුත්තේ දී මුහුණ දෙන්නට සිදු වී ඇති තත්ත්වයන් විවිධ ය. ඉන් කිහිපයක් මෙසේ ය.

.... මුල්කිරිගල පන්සල කලකට පෙර ග්‍රන්ථවලට විශාල ප්‍රසිද්ධියක් දැරුවත් පන්සල්වලට ගෙන යාම නිසා දැන් ග්‍රන්ථ සංඛ්‍යාව සීමා වී ඇත. ඒ පන්සලට මගේ ගමන නිරර්ථක වූයේ නැත. මා මෙතෙක් සොයා ගත් ග්‍රන්ථවලින් වැදගත් ම කෘතිය මෙහි තිබුණි. එය නම් මොග්ගල්ලායන පාලි ව්‍යාකරණයට ලියූ සිංහල කෘතිය මෙහි තිබුණි. එය නම් මොග්ගල්ලායන පාලි ව්‍යාකරණයට ලියූ සිංහල සන්නය යි. එය මා විසින් අවසර ඇතිව ඉල්ලා ගෙනවිත්, ශ්‍රී පාදස්ථානයේ නායක හික්කඩුවේ සුමංගල නාහිමියන්ට සහ බටුවන්තුඩාවේ පඬිතුමන්ට පෙන්වූයෙමි. ඒ දෙපල ම එවැනි පොතක් ඇති බව නො දැන සිටිය හ. එහි දිනයක් නැත. කර්තෘ අඥාතයි. එසේ වූවත් එය 15 වැනි සියවසට පෙර ලියන ලද්දක් විය යුතු යි.[34]

මෙයට හාත්පසින් විරුද්ධ තවත් එතුමාගේ සඳහනක්

.... 23 වැනි දින ගඩලාදෙණි විහාරයට ගියෙමි. එය වැලිවිට හාමුදුරුවන්ගේ පොත් තබා ඇති විශාල ම පොත් ගුලයි කියති. එහෙත් එහි සිටියේ ද අර මල්වත්තේ දී හමුවූ වැලිවිට භික්ෂුව ම බැවින් මට දුන්නේ පොත් 34 ක් පමණි. ඒවා හැම තැන ම දකින්ට ඇති පොත් ය. 24 දින මම ලංකාතිලක පන්සලට

ගියෙමි. එහි අධිපති අමුණුගම හාමුදුරුවෝ පොත් කීපයක් පමණක් මට පෙන්වූහ. වෙනත් කෘති නැතැයි කීහ. එහෙත් එතැන ද විශාල පොත් ගුලක් ඇතැයි මට කීහ. එදින සවස අගුණාවල පන්සලට ගියත් එහි දුර්ලභ පොත් තිබුණේ නැත. 6 වෙනිදා මම මහනුවර දී ආණ්ඩුකාරතුමා සහ ඔබතුමා හමුවීමට සිටියේ, මල්වත්තේ, ගඩලාදෙණියේ සහ ලංකාතිලකයේ පන්සල්වල හාමුදුරුවරු පොත් මට නො පෙන්වූ බව දන්වා සිටිමට යි.[35]

ලුවී ද සොයිසා තම වාර්තාවේ මෙසේ ද සඳහන් කරයි.

.... 27 මම හාරිස්පත්තුවේ පන්සල් බලන්නට ගියෙමි. 28 කටාරංගල පන්සලටත් ගියෙමි. එහි පැරණි සංස්කෘත ග්‍රන්ථ ඇතැයි කී නමුත් මට හමුවූයේ අමරකෝෂය සිංහල අකුරින් ලියූ සන්නයක් සහ වෙස්සන්තර හා විධුර ජාතක සන්නයක් පමණි. ඒවා පිටපත් කර ගන්නටය යි නාහිමියන් මට භාර දුන්න. 29 දා මැදවල පන්සලට ගිය අවස්ථාවෙහි හාමුදුරුවන් කීවේ එහි තිබුණ විශාල පොත්ගුල බ්‍රිතාන්‍ය හමුදාව විසින් 1817 දී මුළුමණින් ම විනාශ කළ බවයි.[36]

ලක්දිව පැරණි පුස්කොළ පොත් පිළිබඳ පූර්ණ වශයෙන් පර්යේෂණ හෝ ප්‍රකාශන දැනට අවසන් නැත. එහෙත් වසර ගණනාවක සිට විවිධ උගතුන් විසින් සිදුකරනු ලැබ ඇති සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රකාශන පිළිබඳ එකතුවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් නිකුත් කොට තිබේ.[37] ලක්දිව පුස්කොළපොත් ආශ්‍රිත තොරතුරු සොයනු ලබන පර්යේෂකයින් සඳහා එය මහඟු යතුරක් වනු නො අනුමානය.

## මූලාශ්‍ර


1. කුලසූරිය, ආනන්ද (1996), **පුස්කොළ පොත් හා ලේඛන කලාව, සංස්කෘතික** පුරාණය, 2 වෙළුම, 1 කලාපය, සංස්, ටී.ජී. කුලතුංග, **මධ්‍යම සංස්කෘතික අරමුදල**, කොළඹ, පි. 35-37.
2. එහි ම.
3. අනුබුදු, අරිසෙන් (2000), අරුත නිරුත, සදීපා, කොළඹ, පි. 84
4. ප්‍රනාන්දු. පී. ඊ. ඊ. (1989) **පැරණි ම සිංහල පුස්කොළ පොත්**, පුරාවිද්‍යා, සංස්, සිරිසමන් විජේතුංග, කොළඹ, පි. 8
5. ඔස්ටින් ද සිල්වා, සී. එම්. (1969), පැරණි **ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය**, අධ්‍යාපන සියවස ප්‍රකාශනය 1, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ. පි. 22
6. විමලරත්න, කේ.ඩී. (1989), **පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය**, ජාතික කෞතුකාගාරය, කොළඹ පි. 5

7. ඌනපූරණසහිතො මහාවංසො, සංස්. පොල්වත්තෙ බුද්ධදත්ත හිමි, 1959, ගුණසේන කොළඹ, පරි. 33 : 102-103

8. එහි ම, පරි. 37 : 234 - 235

9. එහි ම, පරි. 38 : 18

10. එහි ම, පරි. 81 : 41 - 44

11. එහි ම, පරි. 81 : 45

12. එහි ම, පරි. 90 : 37 , 38

13. එහි ම, පරි. 90 : 84

14. එහි ම, පරි. 90 : 79

15. එහි ම, පරි. 92 : 29

16. එහි ම, පරි. 94 : 11

17. සිංහල මහාවංශය, ද්විතීය භාගය, සංස්, සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්, (1963), රත්නාකර, කොළඹ. පි. 370

18. එහි ම. පි. 350

19. එහි ම. පි. 370

20. එහි ම. පි. 350

21. එහි ම. පි. 374

22. එහි ම. පි. 374

23. ශ්‍රී දළදා මාළිගාවේ පුස්තකාලයීය පොත් නාම ලේඛනය. (අමුද්‍රිත), රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව. මහනුවර.

24. කඨිනානිසංස විස්තර සහිත කඨින වංශය, ශ්‍රී පඤ්ඤාසාර හිමි. කොළඹ (1994) සතරවැනි මුද්‍රණය, ගුණසේන. කොළඹ. පි. 148

25. ගුණසේකර, සමන්ත (2005), සිංහල බෞද්ධයා, පෙබරවාරි, පි. 14, (අත් අඩංගුවට ගන්නා ලද පුස්කොළපොත් කීපයක ඡායාරූප එහි විය.)

26. DE SILVA, W.A. (1938) Catalogue of palm leaf manuscripts in the lib. of the Colombo Museum, vol, 1, Ceylon Government Press, Colombo, p.2

27. කරුණාරත්න, ඩබ්. එස්. (1996) භික්ෂුවගේ උරුමය හා කාර්යභාරය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. පි. 51

28. කාරියවසම්, තිස්ස (1994) නූතන ලංකාවේ පැරණිතම පුස්තකාලයක වර්ධනය, විමල් අභයසුන්දර සම්ප්‍රදානය, සංස්. අමර හේවාමද්දුම යන තවත් අය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ. පි. 34.

29. DE SILVA, W.A. (1938) **Catalogue of** palm **Leaf manuscripts in the lib. of the Colombo Museum, vol, 1,** Ceylon Government Press, Colombo, p.11

30. ibid. p. 20

31. ibid. p. 21

32. ibid. p. 23

33. ibid. p. 21

34. කාරියවසම්, තිස්ස (1994) නූතන ලංකාවේ පැරණිතම පුස්තකාලයක වර්ධනය, විමල් අභයසුන්දර සම්ප්‍රදානය, සංස්. අමර හේවාමද්දුම යන තවත් අය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ. පි. 34.

35. එහි ම. පි. 35

36. එහි ම. පි. 36

37. ශ්‍රී ලංකාවේ පුස්කොළපොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය, 2007, සම්පාදනය ප්‍රලේඛන සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, කොළඹ.